**ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (ඉවාසංව්‍යා) - 2014**

**-------------------------------------------------------------------**

ඉරණමඩු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල අතර 2012 ජනවාරි 30 දින එළඹි අංක -I-857 දරන මූල්‍ය ගිවිසුමේ IX ව්‍යවස්ථාවේ 9.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.1 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------**

මූල්‍ය ගිවිසුමට අනුව, එවකට පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වාරිමාර්ග යටිතල පහසුකම්වල ඵලදායිතාවය හා තිරසාර කළමනාකරණය වර්ධනය කිරීම සහ ජලය හා ඉඩම්වල නිෂ්පාදන ධාරිතාවයේ තිරසාර වැඩි දියුණුව ළඟා කරගැනීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 3,812.6 කට සමාන එ.ජ.ඩො. මිලියන 29.32 ක් වූ අතර එයින් රු.මිලියන 2,891 කට සමාන එ.ජ.ඩො. මිලියන 22.23 ක් කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත.ඊට අමතරව රු.මිලියන 160 කට සමාන එ.ජ.ඩො. මිලියන 1.23 ක් පෞද්ගලික අංශයේ සංවිධාන විසින් මූල්‍යයනය කිරීමට අපේක්ෂිත වූ අතර රු.මිලියන 351 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.70 ක් ප්‍රතිලාභීන් විසින් දායක වීමට අපේක්ෂිත විය.ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජනවාරි 30 ආරම්භ කළ අතර 2017 මාර්තු 31 වනවිට අවසන් කිරීමට නියමිත විය.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි වූයේද යන බව.

(ඉ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1 මතය**

**---------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ජේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවස්ථා 52 කදී කොන්ත්‍රාත්කරුවන් වෙත සිදු කළ අතුරු ගෙවීම් වලින් අඩු කළ රු.20,031,272 ක් වූ රඳවා ගැනීමේ මුදල ව්‍යාපෘතියේ වගකීම් ලෙස හඳුනාගෙන තිබුණි. එමනිසා 2014 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ හා ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල්වල අගය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවන් මඟින් රු. 942,204 ක පිරිවැයකට ප්‍රතිපාදනය කළ ගෘහ භාණ්ඩ හා උපකරණ, දේපල වත්කම් හා පිරියත යටතේ දක්වනවා වෙනුවට වැරදි ලෙස සිවිල් වැඩ පිරිවැය ලෙස සලකා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

----------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

----------------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, මූල්‍යයනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | 2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වේ කරන ලද ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) |
| කෘ.සං.ජා.අ. | 22.23 | 2,891 | 600 | 438.60 | 5.68 | 738.92 |
| ශ්‍රී.ලං.ර. | 3.16 | 410 | 90 | 52.60 | 0.70 | 90.55 |
| ප්‍රතිලාභීන්ගේ දායකත්වය | 2.70 | 351 | -- | -- | -- | -- |
| පුද්ගලික අංශ දායකත්වය | 1.23 | 160 | -- | -- | -- | -- |
| එකතුව | 29.32 | 3,812 | 690 | 491.20 | 6.38 | 829.47 |

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් පැකේජ 25 කින් පිරිනමන ලද කොන්ත්‍රාත් 08 ක ඉදිකිරීමේ සිවිල් වැඩ 2014 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණද ඉතිරි පැකේජ 17 යටතේ ඉදිකිරීම් වැඩවල භෞතික ප්‍රගතිය එදිනට සියයට 18 සිට සියයට 90 දක්වා පරාසයක පැවතිණි. තවද, ව්‍යාපෘති කාලය අවසානයට පෙර ඉදිකිරීමේ සිවිල් වැඩ නිම කිරීමට හැකිවන පරිදි මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික ආදී වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක මෙන්ම වගකීම් නිශ්චය කිරීම් ඇතුළත් පුළුල් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘතිය විසින් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිකිරීමේ සිවිල් වැඩ සඳහා ඉංජිනේරු උපදේශකවරයෙක් බඳවා ගැනීම සඳහා ව්‍යාපෘති මූල්‍ය සැලැස්මේ රු. මිලියන 19.23 ක වටිනාකමක් ප්‍රතිපාදනය කර තිබුණද ව්‍යාපෘතිය විසින් නිම කළ වැඩවල ගුණාත්මකභාවය තහවුරු කිරීමට එවැනි උපදේශකයෙක් ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය විසින් ප්‍රතිසංස්කරණය කළ කාණු හා වැව් දිගේ පසුව වැවුණු කැලෑ ශුද්ධ කිරීම සඳහා ප්‍රමාණපත්‍ර යටතේ වැඩ අදාල ප්‍රදේශවල ගොවි සංවිධාන විසින් ක්‍රියාත්මක කළද, පැකේජ 02 හා 12 යටතේ පරන්තන් ප්‍රධාන මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු, පැකේජ 14 යටතේ වෛරියාරු ප්‍රධාන මාර්ගයේ බෙදා හැරීමේ මාර්ග ප්‍රතිසංස්කරණය, පැකේජ 23 යටතේ ඌරියන් මාර්ගයේ බෙදාහැරීමේ මාර්ගවල දකුණු ඉවුර ප්‍රතිසංස්කරණය වැනි ඉදිකිරීමේ සිවිල් වැඩවල නියුතු කොන්ත්‍රාත්කරුවන් එම වැඩ සඳහා එකතුව රු. 1,218,266 ක ගෙවීම් සඳහා ඉල්ලීම් සිදු කර තිබුණු අතර ව්‍යාපෘතිය විසින් ඒ සඳහා ගෙවීම් කර තිබුණි.

(ඇ) පැකේජ 23 යටතේ ඌරියන් මාර්ගයෙහි බෙදාහැරීමේ මාර්ගවල දකුණු ඉවුර ප්‍රතිසංස්කරණය කිරීමේ නියුතු කොන්ත්‍රාත්කරුට පස් පිරිවීමේ කටයුතු භෞතිකව මැනුම් සිදු කිරීමකින් තොරව එකතුව රු. 3,284,130 ක ගෙවීම් සිදු කර තිබුණු බව 2015 අගෝස්තු 21 දින සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතියේ පැකේජ 02 යටතේ ප්‍රතිසංස්කරණය කළ පරන්තන් ප්‍රධාන සොරොව්වේ තාවුල්ල දැඩි ලෙස පළුදු වි තිබුණු බව ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

## 3.4 මතභේදයට තුඩු දෙන වියදම්

----------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) නැගෙනහිර පළාත් සභාවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මඟින් ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කළද දෙපාර්තමේන්තුව සතු වාහන නඩත්තු කිරීම වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් රු. 1,119,080 ක් වියදම් කර තිබුණි.

(ආ) කොන්ත්‍රාත්කරුවකු විසින් සේවයේ යොදවා තිබු තාක්ෂණික නිලධාරියෙකුට රු. 307,973 ක වැටුප් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.